UNIVERSITY OF PERADENIYA
පේරාදෙණිය විශ්වවිද්‍යාලය
CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION
දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

GENERAL DEGREE EXAMINATION IN ARTS (EXTERNAL) - 2014 AUGUST 2015
ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි පරීක්ෂණය (බාහිර) - 2014 (අගෝස්තු) 2015)

# Buddhist Culture -I / බෞද්ධ සංස්කෘතිය I - BCG-1
(නිර්දිෂ්ට ග්‍රන්ථ)

ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.)
(මෙම ප්‍රශ්න පත්‍රයට ඇතුළත් පශ්න සංඛ්‍යාව 10 කි.)
සෑම ප්‍රශ්නයකටම සමාන ලකුණු ලැබේ.. (කාලය - පැය තුනයි)

1. "බුදු සමය නිර්මාණවාදයෙන් වියුක්ත වන අවස්ථාවක් ලෙස අග්ගඤ්ඤ සූත්‍ර දේශනාව හැඳින්විය හැකිය" ඔබේ අදහස් දක්වන්න.

2. "මානසික හා භෞතික ලෝකයේ ක්‍රියාකාරිත්වය මත සමාජ සංස්ථා බිහිවිය" අග්ගඤ්ඤ සූත්‍රය ඇසුරින් විමසන්න.

3. බුදු සමය හා බ්‍රාහ්මණ සමය අතර පවතින සුවිශේෂත්වය කූටදන්ත සූත්‍රය ඇසුරින් විමසන්න.

4. විමුක්ති මාර්ගය උදෙසා සම්පත් අර්ථවත් ලෙස යොදාගත හැකි ආකාරය කූටදන්ත සූත්‍රය ඇසුරින් පරීක්ෂා කරන්න.

5. විනය ගරුක සමාජ සංස්ථාවක් ගොඩනැගීමෙහි ලා කකචූපම සූත්‍රයෙන් ලැබිය හැකි දායකත්වය පරීක්ෂා කරන්න.

6. ධර්මධර හා විනයධර භික්ෂුවකගේ චර්යාව කෙසේ විය යුතු දැයි කකචූපම සූත්‍රය ඇසුරින් විමසන්න.

7. පරිබ්‍රාජක චර්යා හා බෞද්ධ භික්ෂු චර්යා අතර ඇති වෙනස සන්දක සූත්‍රය ඇසුරින් පරීක්ෂා කරන්න.

අනෙක් පිටුවට ...

8. සුඛාවතීව්‍යූහ සූත්‍රයේ ඉගැන්වෙන බෝධිසත්ව චර්යාව පිළිබඳ විමසුමක් කරන්න.

9. ''සුඛාවතී ලෝකය පිළිබඳ රමණීය චිත්‍රයක් සුඛාවතීව්‍යූහ සූත්‍රයේ දැක්වේ'' විමසන්න.

10. පහත මාතෘකා <u>හතරක්</u> සඳහා කෙටි සටහන් ලියන්න.

අ. දස්සු ඛීල

ආ. තර්කය හා වීමංසනය

ඇ. ධම්මී වා කථා අරියො වා තුණ්හීභාවො

ඉ. ආජීවක නියති වාදය

උ. බ්‍රහ්මචරිය

==========

UNIVERSITY OF PERADENIYA
පේරාදෙණිය විශ්වවිද්‍යාලය
CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION
දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

GENERAL DEGREE EXAMINATION IN ARTS (EXTERNAL) - 2014 (AUGUST 2015)
ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි පරීක්ෂණය (බාහිර) - 2014 (අගෝස්තු 2015)

Buddhist Culture -II / බෞද්ධ සංස්කෘතිය II - BCG-2
(බෞද්ධ ආචාර්යවාද)

ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.)
(මෙම ප්‍රශ්න පත්‍රයට ඇතුළත් පශ්න සංඛ්‍යාව 10 කි.)
සෑම ප්‍රශ්නයකටම සමාන ලකුණු ලැබේ.

(කාලය - පැය තුනයි)

1. බෞද්ධ ආචාර්ය වාදයන්ගේ ප්‍රභවයට බලපෑ විවිධ හේතුන් පරීක්ෂා කරන්න.

2. "රහත් භාවය පිළිබඳ මහාදේව හිමියන් ඉදිරිපත් කළ මතවාද මුල් බුදුසමය හා විසංවාදීය." විමසන්න.

3. මහාසංඝිකයන්ගේ ධර්ම සංකල්ප මූලික ථේරවාද ඉගැන්වීම්වලින් වෙනස්වන ආකාරය පැහැදිලි කරන්න.

4. සර්වාස්තිවාදය තහවුරු කිරීමට එම ආචාර්ය වරුන් විසින් ඉදිරිපත් කරන ලද මතවාද විමර්ශනය කරන්න.

5. සෞත්‍රාන්තික සම්ප්‍රදායයේ ඉතිහාසය පරීක්ෂාකොට එහි මූලික ඉගැන්වීම් හඳුන්වා දෙන්න.

6. "ශූන්‍යතාව යනු නිවනම මිස අනෙකක් නොවේ." ඔබේ අදහස් දක්වන්න.

7. යෝගාචාර විඥානවාදී දාර්ශනිකයන් විසින් පිළිගනු ලබන <u>පරිකල්පිත</u>, <u>පරතන්ත්‍ර</u> හා <u>පරිනිෂ්පන්න</u> යන ත්‍රිවිධ ස්වභාවයන් හඳුන්වන්න.

අනෙක් පිටුවට ...

8. මහායානය යනු කුමක්දැයි පැහැදිලි කරන්න.

9. මහායානයෙහි ඉගැන්වෙන ත්‍රිකාය සිද්ධාන්තය පැහැදිලි කරන්න.

10. මහායානිකයන් විසින් තමන්ගේ සහ අනෙකුත් බෞද්ධ සාම්ප්‍රදායිකයන්ගේ නෛරාත්ම සංකල්ප අතර දක්වනු ලබන වෙනස්කම් පැහැදිලිවනසේ මහායාන නෛරාත්ම සංකල්පයේ විශිෂ්ට ලක්‍ෂණ නිර්ණය කරන්න.

**UNIVERSITY OF PERADENIYA**
**පේරාදෙණිය විශ්වවිද්‍යාලය**
**CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION**
**දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය**

GENERAL DEGREE EXAMINATION IN ARTS (EXTERNAL) – 2014 (AUGUST 2015)
ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි පරීක්ෂණය (බාහිර) - 2014 (2015 අගෝස්තු )

## Buddhist Culture - III / බෞද්ධ සංස්කෘතිය - 3 - BCG - 3
## (ශ්‍රී ලංකාවේ බෞද්ධ සංස්කෘතිය)

ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න
(මෙම පත්‍රයට ඇතුළත් ප්‍රශ්න සංඛ්‍යාව 10 කි.
සෑම ප්‍රශ්නයකට ම සමාන ලකුණු ලැබේ.) (කාලය පැය තුනයි.)

1. මිහිඳු හිමියන් ලක්දිවට හඳුන්වා දුන් ථේරවාද බුදුසමයේ ප්‍රකට ලක්ෂණ මොනවාද? නිදසුන් දක්වමින් පැහැදිලි කරන්න.

2. මහාවංස වාර්තාව ආශ්‍රයෙන් ප්‍රාග් බෞද්ධ ලක්දිව ආගමික පසුබිම විමසන්න.

3. පුරාතන ශ්‍රී ලංකාවේ රජවරු සාමකාමී පාලනයක් පවත්වාගෙන යෑම සඳහා යොදාගත් ප්‍රතිපත්ති විස්තර කරන්න.

4. "සිංහල සාහිත්‍ය සම්ප්‍රදාය අඛණ්ඩව පවත්වාගෙන ගිය සදාචාරාත්මක අරමුණක් ඇත." මෙම අදහස ලාංකේය බෞද්ධ සාහිත්‍යය ආශ්‍රයෙන් විමසන්න.

5. පැරණි ලක්දිව බෞද්ධ බිතුසිතුවම්වල ඇති සදාචාරාත්මක වටිනාකම අගය කරන්න.

6. "අනුරාධපුර යුගයේ භෞතික සංස්කෘතියේ ශ්‍රී විභූතියට බෞද්ධ ආර්ථික දර්ශනය බලපා ඇත." නිදසුන් දක්වමින් සාකච්ඡා කරන්න.

7. ශ්‍රී ලාංකිකයන්ගේ චාරිත්‍රවල දක්නට ලැබෙන බෞද්ධ විශ්වාස දක්වන්න.

අනෙක් පිටුවට ...

8. මහායාන බුදුසමය යටතේ ශ්‍රී ලංකාව තුළ ඇති වූ සංස්කෘතික ප්‍රවණතා පිරික්සන්න.

9. පුරාතන ලංකාවේ දේශීය ඇදැහිලි අභිබවා බුදුසමය ජනප්‍රිය වීමට බලපෑ හේතු සාධක තර්කානුකූලව විමසන්න.

10. සෙල්ලිපි ආශ්‍රයෙන් පැරණි ආරාම පරිපාලන ක්‍රමය පිරික්සන්න.

==========